සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 7 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:.................................................... විභාග අංකය:..............................................

## I කොටස

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සත්‍යයට සාක්ෂි දරමින් දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කළ පුද්ගලයින්ව පැරණි ගිවිසුමේ හඳුන්වන්නේ,
    1. වීරවරු ලෙස ය.
    2. රජවරු ලෙස ය.
    3. දිවැසිවරු ලෙස ය.
    4. ආදිපියවරු ලෙස ය.

02. ප්‍රධාන දිවැසිවරු තිදෙනාගේ නම් සඳහන් පිළිතුර වන්නේ,
    1. එලියා, එලීෂා, නාතාන්
    2. එලියා, එලීෂා, යෙසායා
    3. ජෙරමියා, එසකියෙල්, නාතාන්
    4. යෙසායා, ජෙරමියා, එසකියෙල්

03. තම විවාහ දිවිය ම එක්තරා ආකාරයක දිවැසිවර පණිවිඩයක් කර ගත් දිවැසිවරයා වන්නේ,
    1. ආමොස් ය.
    2. ජෙරමියා ය.
    3. හොසියා ය.
    4. ජෝනා ය.

04. දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමාට වූ පොරොන්දුව අනුව ඇති වූ විශාල ජාතිය වන්නේ,
    1. ඉශ්‍රායෙල් ජාතිය.
    2. මිසර ජාතිය.
    3. ඊජිප්තු ජාතිය.
    4. ජුදා ජාතිය.

05. ආබ්‍රහම් තුමාගෙන් පැවත ආ ජාතිය කැප වූ ජාතියක් ලෙස චර්මඡේදය කළ පරිදි අද අපව දේව ජනතාවක් ලෙස කැප කරන්නේ කෙසේ ද?
    1. අභිවෘද්ධි ආලේපනයෙනි.
    2. ප්‍රසාද ස්නාපනයෙනි.
    3. පූජකවරයෙනි.
    4. ආශිර්වාදකාර බන්ධනයෙනි.

06. "ඉන් පසු උපන්නේ ඔහුගේ සහෝදරයා ය. ඔහු තම අතින් ඒසව්ගේ විලුඹ අල්ලාගෙන සිටියේ ය". මෙලෙස උපන් තැනැත්තාගේ නාමය වන්නේ,
    1. ආබ්‍රහම්.
    2. ඊශ්‍රායෙල්.
    3. ඊසාක්.
    4. ජාකොබ්.

07. අප කුමන තත්වයක සිටියත් දෙවියන් වහන්සේගේ කැඳවීම ලත් විට කළ යුතු යුතුකම වන්නේ,

1. සියල්ල පසෙකලා උන්වහන්සේව අනුගමනය කිරීම.
2. තම නිවසේ කටයුතු නිම් කර උන්වහන්සේ අනුව යාම.
3. අපගේ අවශ්‍යතා සපුරා ගත් පසු උන්වහන්සේ අනුව යාම.
4. අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කර ගැනීම.

08. A - පූජකවරය B - රෝගීන්ගේ ආලේපය
C - දිව්‍ය සත්ප්‍රසාදය D - ප්‍රසාද ස්නාපනය

ඉහත ප්‍රසාද නිධාන අතරින් එක් වරක් පමණක් ලබා ගත හැකි ප්‍රසාද නිධාන වන්නේ,

1. A හා B ය.
2. A හා D ය.
3. A හා C ය.
4. B හා D ය.

09. නිර්මල මරිය නිකාය අයත් වන්නේ,

1. පැවිදි සොහොයුරන්ගේ නිකායන්ට ය.
2. පූජක නොවන පැවිදි නිකායන්ට ය.
3. පැවිදි සොහොයුරියන්ගේ නිකායන්ට ය.
4. පැවිදි පූජක නිකායන්ට ය.

10. විවාහ යුවල තම ජීවිත කාලය ම එනම්, මරණය දක්වා ම එකට ජීවත් වීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

1. විවාහයේ ඒකත්වයයි.
2. විවාහයේ අඛණ්ඩතාවයයි.
3. විවාහයේ එකමුතුවයි.
4. විවාහ යුතුකමයි.

11. "මම මාගේ දෙමව්පියන්ට, පූජක පැවිදි උතුමන්ලාට, ගුරුවර ගුරුවරියන්ට, වැඩිහිටියන්ට හා පාලකයන්ට කීකරු වෙමි. ආදරය කරමි. ගෞරව කරමි." ඉහත ප්‍රකාශයට අදාළ දේව පනත වන්නේ,

1. පළමු දේව පනත.
2. දෙවන දේව පනත.
3. හතරවන දේව පනත.
4. අටවන දේව පනත.

12. අටවන දේව පනතින් අපට නියම කරන්නේ,

1. සොරකම් නොකරන ලෙසයි.
2. අන්වස්තු ආශා නොකරන ලෙසයි.
3. කාමයේ වරදවා නොහැසිරෙන ලෙසයි.
4. බොරු නොකියන ලෙසයි.

13. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝතම පියතුමා විසින් හඳුන්වා දෙනු ලැබූ ජපමාල අභිරහස වන්නේ,

1. ආලෝකයේ අභිරහස්.
2. දොම්නස් අභිරහස්.
3. මෝක්ෂ අභිරහස්.
4. සොම්නස් අභිරහස්.

14. සාමාන්‍ය ජපමාලය උච්චාරණය කරන විට භාවිත කරන යැදුමක් වන්නේ,

1. රාත්‍රි ආරාධනාව. 2. උදය ආරාධනය.
3. මංගල්‍ය ආරාධනාව. 4. භෝජන ස්තෝත්‍රය.

15. "වෙස්පර්ස්" යනුවෙන් අදහස් කරන්නේ,

1. උදා යාම යැදුමයි. 2. සන්ධ්‍යා යාම යැදුමයි.
3. දිවා යාම යැදුමයි. 4. රාත්‍රි යාම යැදුමයි.

16. ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම හා උකුත්වීම සිහිපත් කරන භක්ති අභ්‍යාසය වන්නේ,

1. යාච්ඤා කිරීම. 2. පාදනමස්කාරය.
3. ඉටිපහන් දැල්වීම. 4. වන්දනා ගමන් යෑම.

17. ජේසුස් වහන්සේ දර්ශනයක් තුළින් කළ ඇරයුමක ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ වූ පැය භක්ති අභ්‍යාසය ආරම්භ කරන ලදී. එම දර්ශනය දුටු තැනැත්තිය වන්නේ,

1. ශුද්ධ වූ ඇග්නස් තුමිය. 2. මරිය තුමිය.
3. එළිසබෙත් තුමිය. 4. මර්ගරීතා මරිය තුමිය.

18. කිතුනු විශ්වාසය අනුව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජීවමානව වැඩ සිටින්නේ,

1. පාසල තුළ. 2. අප නිවෙස්වල.
3. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ. 4. අප සිත් තුළ.

19. ශ්‍රී ලංකාවේ පවතින ශාන්ත ආනා මුනිතුමියට කැප කළ සිද්ධස්ථානයක් වන්නේ.

1. තලවිල. 2. මඩු පල්ලිය.
3. තේවත්ත. 4. වහකෝට්ටේ.

20. අප දේශයේ ධර්මදූතයාණන් වන ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමාගේ නිජ බිම වන්නේ,

1. ගෝව. 2. පාදුවා.
3. ජෙරුසලම. 4. රෝමය.

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද, තෝරා ගන්නා අනෙකුත් ප්‍රශ්නයකට ලකුණු 11ක් ද බැගින් හිමි වේ.

01. පන්ති කාමරය තුළ ඔබ විසින් සිදු කරන ලද "දේව පනත්" යන ඇගයීම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. දස පනතේ දෙවන කොටසට අනුව අප ප්‍රේම කළ යුත්තේ කාට ද? (ල. 02)
2. දස පනතේ දෙවන කොටසට අයත් පනත් දෙකක් ලියන්න. (ල. 04)
3. දෙමව්පියන් වෙනුවෙන් ඔබගේ යුතුකම් හතරක් ලියන්න. (ල. 04)
4. අප දේපල හා වස්තුව ලබා ගත යුතු ආකාර හතරක් ලියන්න. (ල. 04)
5. අන් අයගේ වස්තුව පිළිබඳ තණ්හාවක් ඇතිකර නොගෙන ලද දෙයින් සතුටු වීමට අපට උගන්වන දේව පනත කුමක් ද? (ල. 02)

02.
1. දේශක දිවැසිවරු දෙදෙනෙක් නම් කරන්න. (ල. 02)
2. යහපත් නායකයෙකු සතු ගුණාංග තුනක් ලියන්න. (ල. 03)
3. දේවස්ථානයේ ගරුත්වය ආරක්ෂා කිරීම සඳහා ඔබට කළ හැකි දේවල් තුනක් ලියන්න. (ල. 06)

03.
1. ඊසාක් තුමාගේ දෙමාපියන්ගේ නම් ලියන්න. (ල. 02)
2. ආබ්‍රහම් තුමාට පරිත්‍යාග කිරීමට සිදු වූ දේවල් තුනක් ලියන්න. (ල. 03)
3. ආදි පීතෘ ඊසාක් තුමාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ තුනක් ලියන්න. (ල. 06)

04.
1. ජේසුස් වහන්සේ ප්‍රථම ශ්‍රාවකයින් කැඳවමින් වදාළ වචන මොනවා ද? (ල. 02)
2. ජේසුස් වහන්සේ තෝරා ගත් අපෝස්තුලුවරුන් හය දෙනෙකුගේ නම් ලියන්න. (ල. 03)
3. ක්‍රිස්තුස් වහන්සේව ලොවට හඳුන්වා දීමට ඔබට කළ හැකි දේවල් තුනක් ලියන්න. (ල. 06)

05.
1. පූජාප්‍රසාදීන් වහන්සේලා බෙදෙන ප්‍රධාන කොටස් දෙක මොනවා ද? (ල. 02)
2. ප්‍රසාද ස්නාපනය මගින් ඔබට පැවරෙන වගකීම් ඉටු කිරීමට දේවස්ථානය තුළ ඇති සමිති සමාගම් තුනක් නම් කරන්න. (ල. 03)
3. කිතුනු දරුවෙකු ලෙස ඔබ ලද කැඳවීම ඉටු කිරීම සඳහා කළ හැකි කාර්යයන් තුනක් ලියන්න. (ල. 06)

06.
1. වර්තමානයේ අප භාවිත කරන ජපමාල බැතිය හඳුන්වා දුන්නේ කවු ද? (ල. 02)
2. සාමාන්‍ය ජපමාලය උච්චාරණය කිරීමේ දී භාවිත කරන යැදුම් තුනක් නම් කරන්න. (ල. 03)
3. ඔබ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ගෞරවය පුද කරන ආකාර තුනක් ලියන්න. (ල. 06)

07.
1. කාලය නාස්ති කිරීම මගින් කඩ වන දේව පනත කුමක් ද? (ල. 02)
2. දස පනත ජීවත් කරවීමට පිළිපැදිය යුතු කරුණු තුනක් ලියන්න. (ල. 03)
3. පාපයෙන් වැළකී යහපත් දරුවෙකු වීමට වරම් පතා දෙව්පියාණන්ට යැදුමක් ලියන්න. (ල. 06)